# සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය

## 1. <u>මූල්‍ය ප්‍රකාශන</u>

### 1.1 <u>මතය</u>

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව , සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, මෙම වාර්තාවේ 1.1ඡේදයේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශන වලට වන බලපෑම හැර 2010 දෙසැම්බර් 31 දිනට සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතු වල මූල්‍ය ප්‍රතිඵල හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට□ අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නාවූ මතය වේ.

### 1.2 <u>මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම</u>

#### 1.2.1 <u>ගිණුම්කරණ අඩුපාඩු</u>

පහත අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) විගණන නියැදි පරීක්ෂාවේදී අනාවරණය වූ එකතුව රු. 17,781,048 ක් වූ ගිණුම්කරණ අඩුපාඩු දැක්වෙන කෙටුම්පත් වාර්තාවක් 2011 ජූලි 08 දින විශ්වවිද්‍යාලයේ උපකුලපතිවරයා වෙත යොමු කරන ලදී. එම සියළුම අඩුපාඩු නිවැරදි කර 2011 ජූලි 31 දින සංශෝධිත මූල්‍ය ප්‍රකාශන විගණනයට ඉදිරිපත් කෙරුණද, තවදුරටත් එවැනි අඩුපාඩු තිබීමේ ඉඩකඩ විගණනයේදී බැහැර කල නොහැකිය.

(ආ) පශ්චාත් උපාධි වැඩසටහනට අදාල වියදම් තුල එම පාඨමාලාවට අදාල නොවූ රු. 1,930,522 ක් වූ විදේශ ගමන් වියදම් ඇතුලත් වී තිබුණද ආදායම් හා වියදම් ගිණුමේ වියදමක් ලෙස එළිදරව් කර නොතිබුණි. එම වියදම වැඩසටහනේ වියදම් වලින් 55% ක් විය.

1.2.2 **නොසැසඳු පාලන ගිණුම්**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සේවක ණය ගිණුම් හතරක සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට පැවැති ණය ශේෂයන්හි එකතුව රු. 19,369,533 ක් වුවද උපලේඛන හා ණය ලේඛන අනුව එදිනට පැවැති ශේෂ පිළිවෙලින් රු. 19,375,702 ක් හා රු. 19,399,859 ක් වූයෙන් පාලන ගිණුම් හා උපලේඛන නොසැසඳුන අවස්ථා තිබුණි.

(ආ) සේවක ණය සහ අත්තිකාරම් විෂයයන් තුනක ගිණුම් අනුව හා උපලේඛන අනුව ශේෂයන් හි රු. 3,508 ක වෙනසක් නිරීක්ෂණය වූයෙන් උපලේඛන සමඟ නොසැසඳු අවස්ථා තිබුණි.

1.2.3 **විගණනය සඳහා සාක්ෂි නොවීම.**

මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති සමාලෝචිත වර්ෂයට පෙර නිකුත් කරන ලද නමුත් මෙතෙක් නිරවුල් කර නොමැති රු. 141,378 ක සැපයුම් අත්තිකාරම් සඳහා විස්තරාත්මක උපලේඛනයක් ඉදිරිපත් කර නොතිබුණි.

1.2.4 **නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම.**

පහත සඳහන් නිති,රීති හා රෙගුලාසි වලට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| **නීති ,රීති හා රෙගුලාසි වලට යොමුව** | **අනුකූල නොවීම** |
| --- | --- |
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය<br>මු .රෙ. 371 | (i) කාර්යය නිම කළ විගස, ලබාගත් අත්තිකාරම් පියවිය යුතු වුවත් සමාලෝචිත වර්ෂයේ අවස්ථා 10 කදී ලබාගත් මිලදී ගැනීමේ අත්තිකාරම් රු.38,900 ක් දින 44 සිට 120 දක්වා කාලයක් ද අවස්ථා 20 කදී ලබාගත් මිශ්‍ර අත්තිකාරම් රු.534,735 ක් දින 07 සිට 206 දක්වාද ප්‍රමාද වී පියවා තිබුණි. 2009 වර්ෂයට පෙර අවස්ථා 02 කදී ලබාගත් රු.18,200 ක අත්තිකාරම් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් පියවා නොතිබුණි. |

| | |
|---|---|
| | (ii) නොපියවන ලද මිශ්‍ර අත්තිකාරම් තුල 2004 වර්ෂයේදී දෙන ලද රු. 25,732 ක්, 2006 වර්ෂයේදී දෙන ලද රු.1,500 ක් සහ සමාලෝචිත වර්ෂයේ ඔක්තෝබර් මාසයේදී දෙන ලද රු. 150,600 ක් විගණන දිනය වන විටත් පියවා නොතිබුණි. |
| (ආ) 2006 මාර්තු 01 දිනැති ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4:2:1 වගන්තිය | වසර 03 කට ප්‍රධාන මිලදී ගැනීමේ හා වාර්ෂික සවිස්තරාත්මක මිලදී ගැනීමේ සැලසුම් සකස් කල යුතු වුවත් ඊට පටහැනිව සමාලෝචිත වර්ෂය තුල රු. 52,908,686 ක් වටිනා මිලදී ගැනීම් සිදුකර තිබුණි. |
| (ඇ) ශ්‍රී ලංකා පජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ ii පරිච්ඡේදය 9.1 වගන්තිය හා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ උසස් අධ්‍යාපන ආයතන සඳහා වූ ආයතන සංග්‍රහයේ iii පරිච්ඡේදයේ 18.16.6 (ආ) හා 2007 අගෝස්තු 24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 09/2007/(1) | අමාත්‍ය මණ්ඩලයේ පූර්ව අනුමැතියෙන් තොරව වයස අවු.60 ඉක්මවූ නිලධාරියෙකු 2005 වර්ෂයේ දෙසැම්බර් මාසයේ සිට වර්ෂ 05 කට වැඩි කාලයක් මාස හයෙන් හයට විවිධ කාර්යයන් පවරමින් සේවයේ යොදවා තිබුණි. |

### 1.2.5 ප්‍රමාණවත් අධිකාරී බලයකින් තහවුරු නොවූ ගනුදෙනු

රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ 1994 ජුනි 14 දින හා අංක 95 දරන චක්‍රලේඛයේ විධිවිධාන වලට පටහැනිව ආයතනයේ කාර්ය මණ්ඩලය සඳහා භාෂා ප්‍රවීනතා දීමනා ලෙස සමාලෝචිත වර්ෂයේදී රු.165,475 ක් ගෙවා තිබුණි.

## 2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

### 2.1 මූල්‍ය සමාලෝචනය

#### 2.1.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආයතනයේ මෙහෙයුම් කටයුතු වල මූල්‍ය ප්‍රතිඵලය පුනරාවර්තන වියදම් සඳහා රජයේ ප්‍රදානය ගණන් ගැනීමට පෙර රු. 283,040,641 ක ඌනතාවයක් වූ අතර, ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 243,233,010 ක් විය. පුනරාවර්තන වියදම් සඳහා රජයෙන් ලැබුණු රු. 284,600,000 ක් වූ ප්‍රදානය හේතුකොටගෙන සමාලෝචිත වර්ෂයේ ඌනතාවය රු. 1,559,359 ක අතිරික්තයක් බවට පත් වී තිබුණි. ඉකුත් වර්ෂය වෙනුවෙන් පුනරාවර්තන වියදම් සඳහා රජයෙන් ලැබුණු රු. 232,100,000 ක ප්‍රදානය හේතු කොට ගෙන එම වර්ෂයේ ඌනතාවය රු.11,133,010 ක් දක්වා අඩු වී තිබුණි.

#### 2.1.2 ලැබී ඇති ප්‍රාග්ධන ප්‍රතිපාදන වල ඌනතාවය

වැයනොවූ මූලධන ආධාර ගිණුමේ ශේෂයට □ සමාන මුදල් ප්‍රමාණයක් ඊට අදාල බැංකු ජංගම ගිණුමේ තිබිය යුතු වුවද සමාලෝචිත වර්ෂය අවසානයේ වැය නොවූ මූලධන ආධාර ලෙජර ගිණුමේ ශේෂය රු. 31,455,664 ක් වන අතර ඊට අදාල බැංකුවේ ජංගම ගිණුමේ ශේෂය රු. 3,937,122 ක් විය.

### 2.2 මෙහෙයුම් සමාලෝචනය

#### 2.2.1 අධ්‍යයන කාර්ය සාධනය

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) අධ්‍යයන කටයුතු

2008 සහ 2009 යන වර්ෂ වලදී පැවැත්වූ උසස් පෙළ විභාගයෙන් සමත් සිසුන් කාණ්ඩ දෙකම සමාලෝචිත වර්ෂයේදී ලියාපදිංචි කරගෙන තිබුණි. විස්තර පහත දැක්වේ.

| පීඨය | උසස් පෙළ සමත් වර්ෂය | අධ්‍යයන වර්ෂය | 2010 වර්ෂයේදී පළමු වසරට ලියාපදිංචි සිසුන් සංඛ්‍යාව | | ඉගෙනුම ලබන මුළු සිසුන් සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| දෘශ්‍ය කලා | 2008 | 2008/2009 | 59 | 120 | 286 |
| | 2009 | 2009/2010 | 61 | | |
| සංගීත | 2008 | 2008/2009 | 138 | 277 | 685 |
| | 2009 | 2009/2010 | 139 | | |
| නර්තන හා නාට්‍ය කලා | 2008 | 2008/2009 | 195 | 383 | 935 |
| | 2009 | 2009/2010 | 188 | | |
| එකතුව | | | | 780 | 1906 |

(i) 2008 වර්ෂයේදී උසස් පෙළ සමත් සිසුන් 392 ක් 2009 වර්ෂයේදී ලියාපදිංචි කර නොතිබූ බැවින් එම සිසුන් ලියාපදිංචි කරගැනීම වර්ෂයකින් ප්‍රමාද වී තිබුණි.

(ii) අධ්‍යයන වර්ෂ දෙකක සිසුන් බඳවා ගැනීම හේතුවෙන් ලියාපදිංචි සිසුන් සංඛ්‍යාව ඉකුත් වර්ෂයට සාපේක්ෂව දෙගුණයක් වී තිබුණි.

(iii) 2008 වර්ෂයේ අපොස (උ .පෙළ) විභාගය සමත් සිසුන් ඊළඟ වර්ෂයේ අධ්‍යයන කටයුතු සඳහා ලියාපදිංචි කර නොගැනීම නිසා උපාධිය හැදෑරීම සඳහා දීර්ඝ කාලයක් ගතකිරීමට සිදුව තිබුණි.

## (ආ) විභාග ප්‍රතිඵල

2002/2003, 2003/2004 සහ 2004/2005, 2005/2006 අධ්‍යයන වර්ෂයන්ට අදාළව 2010 වර්ෂයේ පවත්වන ලද අවසන් වසර පරීක්ෂණවල ප්‍රතිඵල 2011 වර්ෂයේ නිකුත් කර තිබුණි. එම ප්‍රතිඵල පිළිබඳ විස්තර පහත දැක්වේ.

| පීඨය | පාඨමාලාව | විභාගයට පෙනීසිටි මුළු සිසුන් සංඛ්‍යාව | පළමු පෙළ සමත් | දෙවන පෙළ ඉහළ සමත් | දෙවන පෙළ පහළ සමත් | සාමාන්‍ය සමත් | ඌන සමත්/ අසමත් |
|---|---|---|---|---|---|---|---|
| සංගීත | ප්‍රාසාංගක කලාවේදී (විශේෂ) | 268 | 15 | 69 | 62 | 52 | 70 |
| නර්තන හා නාට්‍ය | ප්‍රාසාංගික කලාවේදී (විශේෂ) | 365 | 04 | 62 | 125 | 153 | 21 |
| | ප්‍රසාංගික කලාවේදී (විශේෂ) | 340 | 18 | 96 | 108 | 88 | 30 |
| දෘශ්‍ය කලා | ලලිත කලාවේදී (විශේෂ) | 112 | 08 | 22 | 20 | 56 | 06 |

(i) සංගීත පීඨයේ සහ නර්ථන හා නාට්‍ය කලා පීඨයේ 2008/2009 අධ්‍යයන වර්ෂයේදී පැවැත්විය යුතු පරීක්ෂණ 2010 වර්ෂයේ අගෝස්තු හා නොවැම්බර් මාසවල ප්‍රමාද වී පවත්වා තිබූ අතර ප්‍රතිඵල 2011 වර්ෂයේ පෙබරවාරි හා අප්‍රේල් මාසවල නිකුත් කර තිබුණි.

(ii) නර්ථන හා නාට්‍ය කලා පීඨයේ 2007/2008 අධ්‍යයන වර්ෂයේදී පැවැත්විය යුතු ප්‍රාසාංගික කලාවේදී විශේෂ උපාධි පරීක්ෂණ ප්‍රමාද වී 2009 වර්ෂයේ නොවැම්බර් මාසයේදී පවත්වා අවසන් කර තිබූ අතර දෘශ්‍ය කලා පීඨයෙහි 2007/2008 අධ්‍යයන වර්ෂයේදී පැවැත්විය යුතු ලලිතකලාවේදී විශේෂ උපාධි පරීක්ෂණ වසරකට වැඩි කාලයක් ප්‍රමාද වී 2010 වර්ෂයේදී පවත්වා තිබුණි. එම පීඨයේ 2008/2009 අධ්‍යයන

වර්ෂයේදී පැවැත්විය යුතු උපාධි පරීක්ෂණ 2011 ජූනි මාසය අවසාන වන විටත් පවත්වා අවසන් කර නොතිබුණි.

(ඇ) <u>වාර්ෂික පර්යේෂණ පරිසංවාදය (Symposium)</u>

අයවැය ඇස්තමේන්තුවෙහි පර්යේෂණ හා ප්‍රකාශන සඳහා රු. 170,000 ක් වෙන් කර තිබුණද සමාලෝචිත වර්ෂය තුල ඒ සඳහා වැය කර තිබූ මුදල රු. 34,500 ක් විය. 2010 වර්ෂයේදී පර්යේෂණ සංක්ෂිප්ත වාර්තා 39 ක් ලැබී තිබුණු අතර එයින් 25 ක් නිවැරදි කිරීම් කමිටුව වෙත නැවත ඉදිරිපත් කර ඇතත් මෙතෙක් පරිසංවාදයකට ලක්කර නොතිබුණි. මේ අනුව විශ්වවිද්‍යාලයේ ප්‍රධාන අරමුණක් වන පර්යේෂණ කටයුතු සඳහා ප්‍රමාණවත් දායකත්වයක් ලබා දී නොතිබුණි.

2.2.2 <u>කොන්ත්‍රාත් පරිපාලනය</u>

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) දෘශ්‍ය කලා පීඨයේ කලාගාරය ප්‍රතිසංස්කරණය කිරීමේ කොන්ත්‍රාත්තුව 2004 වර්ෂයේ ආරම්භ කර තිබූ අතර 2007 වර්ෂයේ ජූනි මාසයේදී වැඩ අවසන් කිරීමට නියමිතව තිබුණද වැඩ අවසන් කරන විට 2008 වර්ෂයේ මැයි මාසය දක්වා වර්ෂයක කාලයක් ප්‍රමාද වී තිබුණි. එම ප්‍රතිසංස්කරණ කටයුතුවල අඩුපාඩු හඳුනාගෙන තිබුණද සමාලෝචිත වර්ෂය අවසාන වන විට වර්ෂ 2 1/2 ක් ඉකුත් වී ඇතත් එම අඩුපාඩු නිවැරදි කර නොතිබුණි. මෙම කොන්ත්‍රාත්තුවේ අවසාන බිල්පතද අස්ථානගතවී තිබූ අතර එහි පිටපතකට ගෙවීම් කටයුතු සිදුකර තිබුණි.

(ආ) ඇස්තමේන්තුගත පිරිවැය රු.95,233,365 ක් වූ සංගීත පීඨ සහ නර්තන පීඨ ගොඩනැගිලි ඉදිකිරීමේ ව්‍යාපෘතියේ දෙවන අදියරෙහි කොන්ත්‍රාත් ගිවිසුමට අනුව එම□ ඉදිකිරීම වර්ෂ දෙකකින් නිමකල යුතු වුවද සමාලෝචිත වර්ෂය අවසාන වන විට වර්ෂ 03 ක් ඉකුත් වී ඇතත් වැඩ නිම වී නොතිබුණු අතර ප්‍රමාද ගාස්තු රු.2,380,834 ක මුදලද අයකර ගෙන නොතිබුණි.

2.2.3 <u>කළමනාකරණ අකාර්යක්ෂමතා</u>

පහත සඳහන් කරුණු කිරීක්ෂණය කරනු ලැබේ.

(අ) නිශ්චිත අරමුදල් 05 කට අදාලව රු. 135,613 ක් එකී අරමුදල් නමින් ආයෝජනය කර නොතිබුණි.

(ආ) සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය සහ නේවාසිකාගාර පවත්වාගෙන යන රු. 2,117,041,000 ක් වූ වටිනාකමට තක්සේරු කරන ලද ඉඩම් සමාලෝචිත වර්ෂයේ ශේෂපත්‍රයේ ස්ථාවර වත්කම් යටතේ ගිණුම්ගත කර තිබුණද එම ඉඩම්වල නිත්‍යානුකුල අයිතිය ලබාගෙන නොතබුණි.

(ඇ) 2006 මාර්තු 01 දිනැති ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.8.4 ඡේදයට අනුව තාක්ෂණික ඇගයීම් කමිටුවට ආයතනයෙන් බාහිර සාමාජිකයෙකු පත් කළයුතු වුවද එවැනි බාහිර සමාජිකයෙකු රහිත තාක්ෂණික ඇගයීම් කමිටුවක් විසින් ආරක්ෂක සේවා සැපයීම සඳහා ලැබී තිබූ ලංසු ඇගයීම් කර තිබූ අතර ලැබී තිබූ ලංසු 12 කින් ලංසු 09 ක් විවිධ හේතු සඳහන් කරමින් ඇගයීමෙන් ඉවත් කර තිබුණි. තාක්ෂණික ඇගයීම් කමිටුව කරන ලද නිර්දේශ ප්‍රසම්පාදන කමිටුව ප්‍රතික්ෂේප කර තිබූ අතර ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතිය නොමැතිව බදු රහිත මාසික සේවා ගාස්තුව රු.1,348,500 ක් වූ වැඩි පිරිවැයකට කොන්ත්‍රාත් ප්‍රදානය කර තිබුණි.

2.2.4 **නිශ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

දීර්ඝ කාලයක සිට චලනය නොවී පවතින රු. 265,096 ක් වූ තොග විෂයයන් සඳහා සුදුසු පරිදි කටයුතු නොකර තවදුරටත් ඉතිරි තොගයක් ලෙස පෙන්නුම් කර තිබුණි.

2.2.5 **පුස්තකාල පරිපාලනය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ආචාර්යවරයෙකුට පොත් 10 ක උපරිමයකට යටත්ව බැහැර ගෙනයාම සඳහා පුස්තකාල පොත් නිකුත් කිරීමට ඉඩදී ඇතත් ඉන් බැහැරව ආචාර්යවරයෙකුට පොත් 36 ක් දක්වා ප්‍රමාණයක් නිකුත් කල අවස්ථා නිරීක්ෂණය විය. මෙම පොත් වලින් 2010 දෙසැම්බර් මාසය වන විට ආපසු භාරදීමේ කාලය ඉකුත්ව තිබූ නමුත් ආපසු භාරදී නොමැති පොත් සංඛ්‍යාව 79 ක් විය.

(ආ) පුස්තකාලයේ බැහැර දෙන අංශය මගින් වර්ෂ 2000 සිට 2006 දක්වා කාලය තුල සිසුන් වෙත නිකුත් කල පොත් වලින් ආපසු භාර දී නොමැති පොත් සංඛ්‍යාව 350 ක් වූ අතර 2007 වර්ෂයේ සිට 2010 වර්ෂය දක්වා නිකුත් කරන ලද පොත් වලින් ආපසු භාර දී නොතිබූ පොත් සංඛ්‍යාව 150 කි.

2.2.6 **නේවාසිකාගාර පාලනය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2007 ඔක්තෝබර් 17 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව රාජගිරියේ සහ දෙහිවල ඉදිකිරීමට යෝජිත නේවාසිකාගාර සඳහා රු. 165,400,000 ක ප්‍රතිපාදන සලසා තිබියදී එම ඉදිකිරීම් කටයුතු සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් ආරම්භ කර නොතිබූ අතර කුලීපදනම මත ලබාගත් නේවාසිකාගාර 16 ක් වෙනුවෙන් වාර්ෂිකව රු. 12,300,000 ක කුලියක් ගෙවමින් නේවාසිකාගාර පහසුකම් සලසා තිබුණි.

(ආ) කුලියට ලබාගන්නා ලද නේවාසිකාගාර 07 ක් සඳහා රජයේ තක්සේරු කුලියට වඩා රු.95,000 ක් වැඩියෙන් මාසික කුලී ගෙවමින් පවතින බැවින් එම නිවාස තක්සේරු කිරීම සඳහා ගෙවන ලද රු.165,399 ක මුදල අනාර්ථික පිරිවැයක් බව නිරීක්ෂණය විය.

2.2.7 <u>වාහන පාලනය</u>

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වෑන් රථ 07 ක් කුලී පදනමට ලබාගෙන තිබූ අතර එයින් වාහන 03 ක් පෙට්‍රල් භාවිතයෙන් ධාවනය වන බැවින් ඉන්ධන පිරිවැයෙහි අවාසිදායක බවක් නිරීක්ෂණය වන අතර ඉන්ධන පාලනය නොකිරීමට☐ හා වාහන ඌන උපයෝජන තත්වයක පැවතීම නිසා එම කටයුතු අරපිරිමැසුම් දායක ලෙස ඉටුකරගැනීමට අපොහොසත් වී තිබුණි.

(ආ) වාහන කුලී ගිවිසුම්වල ඉන්ධන ලීටරයකට ධාවනය විය යුතු උපරිම කි.මී. ගණන දක්වා ඇති අතර ඊට වඩා අඩුවෙන් ධාවනය වුවහොත් ගිවිසුම් ප්‍රකාරව වැඩිපුර දහනය වන ඉන්ධනවල පිරිවැය ගෙවනු ලබන වාහන කුලියෙන් අඩුකරගත යුතු වුවත් පරීක්ෂා කල මාස 07ක නියැඳිය තුල රු.255,141ක් වූ එම පිරිවැය එසේ අඩුකරගෙන නොතිබුණි.

(ඇ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමැතියෙන් තොරව අනුමත මාසික අතිකාල පැයගණන ඉක්මවා වැඩකල රියදුරන් 04 දෙනෙකුට මාස 08 ක් තුල රු.342,625 ක් අතිකාල වශයෙන් ගෙවා තිබුණි.

2.2.8 <u>සංයුක්ත සැලැස්ම</u>

බාහිර ආයතනයක් වෙත රු. 959,445 ක් ගෙවා 2008 -2012 කාල පරිච්ඡේදය ආවරණය වන පරිදි සංයුක්ත සැලැස්මක් පිළියෙල කර තිබුණද එම සැලැස්ම අංක PED/12 හා 2003 ජූනි 02 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව යාවත්කාලීන කර නොතිබූ අතර එය පාලන කාරකයක් ලෙස භාවිතා කර නොතිබුණි.

2.2.9 <u>අයවැය පාලනය</u>

සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කරන ලද අයවැය ලේඛනය වර්ෂය අවසාන වන තෙක්ම පාලක සභාව අනුමත කර නොතිබුණි. වර්ෂයේ අයවැය ගත හා තථ්‍ය ආදායම් වියදම් අතර සැලකිය යුතු විචලනයන් වුයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් වශයෙන් උපයෝගි කරගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

3. **පද්ධති හා පාලන**

විගණනයේදි නිරික්ෂණය වු පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර විශ්වවිද්‍යාලයේ උපකුලපතිවරයා වෙත දැනුම් දෙන ලදි. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුවේ.

(අ) විවිධ අත්තිකාරම්

(ආ) කොන්ත්‍රාත් පරිපාලනය

(ඇ) නේවාසිකාගාර පාලනය

(ඈ) වාහන පාලනය

(ඉ) ගබඩා පාලනය